### ආරක්ෂක අමාත්‍යාංශය

### ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවත්නා ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනයේ පර්යේෂණ විශ්ලේෂක තනතුර (තාවකාලික) සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම.

ආරක්ෂක ආමාත්‍යාංශය යටතේ පවත්නා ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනයේ පර්යේෂණ විශ්ලේෂක තනතුරේ හි (තාවකාලික) පවතින පුරප්පාඩු 01ක් පිරවීම සඳහා මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *බඳවා ගැනීමේ ක්‍රමය* :
නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින්, ආරක්ෂක අමාත්‍යාංශය විසින් පත්කරනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයා බඳවා ගනු ලැබේ.

පත්වීම ක්‍රියාත්මක වන දිනය ආරක්‍ෂක අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු ලැබේ.

02. *අවශ්‍ය සුදුසුකම්* :

(i) *අධ්‍යාපන සුදුසුකම්—*
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධි ප්‍රදානය කරන ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති ආයතනයකින් හෝ පිරිනමනු ලබන ජාත්‍යන්තර සබඳතා/සාමය හා ගැටුම් නිරාකරණ අධ්‍යයනය/ආරක්ෂක අධ්‍යයනය/බුද්ධි සේවා අධ්‍යයනය/ත්‍රස්තවාදය/සමාජ විද්‍යාව/දේශපාලන විද්‍යාව/නීතිය/ආර්ථික විද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධියක් සහ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.

(ii) *පළපුරුද්ද-*
පර්යේෂණ කටයුතු සම්බන්ධව වන ක්ෂේත්‍රයකින් ලබාගත් අවම වශයෙන් වසර 02 ක පළපුරුද්දක් සහිත වීම.

(iii) *කායික සුදුසුකම්-*
ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙ හි රාජකාරී ඉටුකිරීමට ත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(iv) *වෙනත් සුදුසුකම්-*
(අ) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
(ආ) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
(ඇ) අයදුම්පත් කැඳවන අවසන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා වන සුදුසුකම් සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතුය.

3. *වයස් සීමාව :*
ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස අවු 21 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

4. *වැටුප් පරිමාණය :*

මෙම තනතුර සඳහා මූලික වැටුප රු. 53,150 + ජීවන වියදම් දීමනාව රු. 7,800 - රු. 60,950 මාසික දීමනාවක් හිමි ය. (ඔබට වැටුප් ගෙවනු ලබන්නේ 2016.04.25 දිනැති සහ 2016.10.21 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/216 හා 02/2016 (1) හි විධිවිධාන පරිදි වේ.)

5. යෝග්‍යතා ඇගයීම් සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ. :

| *ලකුණු ප්‍රදානය කරනු ලබන ශීර්ෂ* | | *ලකුණු බෙදී යන ආකාරය* | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| 01. | *අතිරේක අධ්‍යාපන* / වෘත්තීය සුදුසුකම් | | |
| | අතිරේක අධ්‍යාපන සුදුසුකම්<br>(මූලික සුදුසුකම් හා මූලික සුදුසුකම් සඳහා හේතු වන ලද සුදුසුකම් හැර) | | |
| | ක්ෂේත්‍රයට අදාළව ලබා ගන්නා ලද පශ්චාත් උපාධිය/පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | ලකුණු 10 | ලකුණු 10 |
| | ක්ෂේත්‍රයට අදාළව ලබා ගන්නා ලද උසස් ඩිප්ලෝමාව | ලකුණු 07 | |
| | ක්ෂේත්‍රයට අදාළව ලබා ගන්නා ලද ඩිප්ලෝමා | ලකුණු 05 | |
| | ක්ෂේත්‍රයට අදාළව ලබා ගන්නා ලද සහතිකපත්‍ර පාඨමාලා | ලකුණු 03 | |
| | අතිරේක වෘත්තීය සුදුසුකම් | | ලකුණු 10 |
| | පිළිගත් පර්යේෂණ ජර්නල්වල පර්යේෂණ පත්‍ර ප්‍රසිද්ධකර තිබීම | ලකුණු 10 | |
| | පිළිගත් විද්වත් සංගම්වල සාමාජිකත්වය | ලකුණු 05 | |
| 02. | *අතිරේක පළපුරුද්ද :*<br>ක්ෂේත්‍රයට අදාළව ලබාගත් පළපුරුද්ද සඳහා (මූලික සුදුසුකම් සඳහා සලකා බලනු ලබන වසර 02 ක පළපුරුද්දට අමතරව සලකා බලනු ලැබේ. | වසරකට ලකුණු 05 බැගින් (උපරිම වසර 7ක් සඳහා | ලකුණු 35 |
| 03 | *පරිගණක හැකියාව*<br>වාචික ප්‍රශ්න 5 (ප්‍රායෝගික දැනුම) | ප්‍රශ්නයකට ලකුණු 4 බැගින් | ලකුණු 20 |
| 04 | *භාෂා ප්‍රවීණතාව :*<br>ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය සළකා බලනු ලැබේ. | | |
| | ලිඛිත පරීක්ෂණය (විනාඩි 30) | ලකුණු 10 | ලකුණු 20 |
| | වාචික ප්‍රශ්න/ප්‍රායෝගික දැනුම | ලකුණු 10 | |

| ලකුණු ප්‍රදානය කරනු ලබන ශීර්ෂ | | ලකුණු බෙදී යන ආකාරය | උපරිම ලකුණු |
|---|---|---|---|
| 05 | සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතා :<br>➢ කුසලතාවය<br>➢ නායකත්වය<br>➢ ආකල්ප<br>➢ පෞරුෂත්වය<br>➢ සන්නිවේදනය | <br>1<br>1<br>1<br>1<br>1 | 05 |
| | මුළු එකතුව | | 100 |

6. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :*

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින් ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.
(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

7. *අයදුම්පත් ඉදිරිපත් කළයුතු ආකාරය :*

(i) සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2023.04.21** දිනට හෝ එදිනට ප්‍රථම, ලේකම් ආරක්ෂක අමාත්‍යාංශය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 04 දක්වාත් දෙවැනි පිටුව අංක 05 සිට 07 දක්වාත් වන ආකාරයෙන් සම්පූර්ණ කළ යුතුය.

(iii) අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ "ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනයේ ''පර්යේෂණ විශ්ලේෂක තනතුර (තාවකාලික) සඳහා අයදුම් කිරීම" යනුවෙන් සඳහන් කළ යුතුය.

(iv) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයෙකු/ සාමදාන විනිශ්චයකාරවරයෙකු/ දිවුරුම් කොමසාරිස්වරයෙකු/ නීතිඥවරයෙකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධරයෙකු හෝ රු. 47,615/-ක මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතුය.

(v) මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිඳු පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

8. *සාවද්‍ය තොරතුරු සැපයීම :*
ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

9. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

10. මෙම නිවේදනයේ සඳහන් නොවන කරුණක් සම්බන්ධයෙන් හෝ මෙම බඳවා ගැනීමේ ක්‍රියාමාර්ගය තුළ කිසියම් ගැටලුකාරී තත්ත්වයක් ඇති වුවහොත් ඒ පිළිබඳව ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් විසින් ගනු ලබන තීරණය අවසාන තීරණය වේ.

ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,
ශ්‍රී ජයවර්ධනපුර,
කෝට්ටේ.

2023 මාර්තු මස 23 වැනි දින.